

# අපගේ මතකය
# වනාහි
# විඩියෝ පටය

අප අවට පෙනෙනා සහ ඇසෙනා ජවනිකා සහ ශබ්ද එලෙසම සටහන් කිරීමට, විඩියෝ කැමරාවක් මගින් දැනට පුළුවන. මෙම විඩියෝ පටය පසුව තිරයක් මත ක්‍රියාකරන අවස්ථාවේදී සිදුවූ දේවල් ඒ අන්දමට රඟ දක්වනු ඇත.

අප පිළිබඳව, අප සියලු දෙනාම, දෙවියන් වහන්සේට ගණන් දිය යුතු දවසක් පැමිණෙන බව බයිබලය පවසයි. මිනිස් ඉතිහාසයේ බොහෝ ශත වර්ෂ ගණනාවක් තුළ වාසය කළ කෝටි ගණන් සියලු ජනයා ගැන සලකන විට, සෑම මිනිසෙකු විසින් තමාගේ ජීවිත කාලය තුළ කළ කී සහ සිතූ දේවල් ගැන සටහනක් දෙවියන් වහන්සේ තබන්නේ කෙසේද කියා අප මවිත වෙනු ඇත. මෙම සටහන දෙවියන් වහන්සේ විසින් එක් එක්කෙනාගේ මතකය තුළ තබනු ඇත.

අප කරන්නාවූ, කියන්නාවූ සහ සිතන්නාවූ සියල්ලක්ම විශ්වාසදායක ලෙස සටහන් කරන්නාවූ විඩියෝ-පටයක් ලෙස මතකය තිබේ. තවද, එය අපගේ අභ්‍යන්තර ආකල්ප සහ අභිප්‍රායන් සටහන් කරයි. කෙනෙක් මැරෙන විට, ඔහු තමාගේ ශරීරය භූමියෙහි තබා ගියත්, ඔහුගේ මතකය තමාගේ ප්‍රාණයෙහි කොටසක් වන බැවින්, ඔහුගේ ප්‍රාණය සමඟ, මැරුණු ආත්ම වෙසෙන ස්ථානයට යයි. විනිශ්චය දිනය අවසාන ලෙස පැමිණෙන විට, වරක් තමාගේ ශරීරය වූ දූවිල්ලට ඔහුගේ ප්‍රාණය එකතුවී, ඔහු භූමිය මතුපිට ගත කළ ඔහුගේ සම්පූර්ණ ජීවිතය





ගැන උන්වහන්සේට ගණනක් දීමට දෙවියන් වහන්සේ ඉදිරිපිට ඔහු සිටිනු ඇත.

ඒ දවසේදී විනිශ්චය සඳහා එක් එක් කෙනාගේ වාරය එළඹෙන විට, දෙවියන් වහන්සේ විසින් කළ යුත්තේ, මුළු ලෝකයා විසින් ඔහුගේ ජීවිතයේ සටහන දකින පිණිස, මනුෂ්‍යයාගේම මතකය නමැති විඩියෝ පටය, තිරයක් මත නැවත ක්‍රියා කිරීම පමණයි. කිසිවෙකු විසින් ඒ ප්‍රදර්ශනයේ නිවැරදිකම ප්‍රශ්ණ කිරීමට නොහැකි වනු ඇත. මක්නිසාද එය මිනිසාගේම මතකය තුළින් ඔහුගේ භූමික ජීවිතයේ විස්තර නැවත ක්‍රියා කිරීමක් වන බැවිනි.

ජනයා අද දින දරන්නාවූ වීනිත බවයෙහි සහ ආගමිකත්වයෙහි පිටස්තර බොරු ඔපය, ඒදින ඉවත් කරනු ලැබ, සත්‍යවූ අභ්‍යන්තර තැනැත්තා එවිට අනාවරනවනු ඇත. ඒ දවසේදී, ආගම කිසිවෙකු ගළවන්නේ නැත. මක්නිසාද, ඔවුන් කුමන ආගමකට ඉපදුනත්, කුමන ආගමක් ඇදහුවත්, සියල්ලෝම පව් කළ ඇති බව පැහැදිලිව පෙනෙනු ඇත. කළ යහපත් ක්‍රියා, දිළිඳුන්ට හෝ දේවස්ථානයකට හෝ පන්සලකට හෝ පල්ලියකට දී ඇති මුදල් කිසිවෙකු ගළවන්නේ නැත. මක්නිසාද ආගමික කටයුතු කිසිවක් මගින් අපගේ පාප සටහන මකා දමන්නට නොහැකිය.

විනිශ්චය දවසේදී, විඩියෝ-පටය ආපසු ක්‍රියා කිරීම අවශ්‍ය නොවන පරිදි, අප විසින් කළ, ක්‍රියා සහ සිතූ දුෂ්ඨ දේවල සටහන, දෙවියන් වහන්සේගේ දර්ශනයෙන් ස්ථිර



ලෙස මකාදැමීම පිණිස ඇත්තේ එකම මාර්ගයක් පමණි. අපගේ යහපත් ක්‍රියා මගින් අප කර ඇති දුෂ්ඨ ක්‍රියා මකා දමන්නට නොහැකිය. නැත. කිසිවිටකත් නොහැකිය. අප කර ඇති පව් වෙනුවෙන් සාධාරණ සහ ධර්මිෂ්ඨ දඬුවමක් නියම කළ යුතුව තිබේ. දේව ව්‍යවස්ථාව තුළ පාපය සඳහා එකම දඬුවමක් පමණක් නියම කර ඇති බව බයිබලය පවසයි. එය මරණයයි. අපගේ පව් වෙනුවෙන් අප එක් එක්කෙනා විසින්ම ලැබීමට සුදුසු වනුයේ මේ මරණයයි.

වසර 1900 කට අධික කලකට පෙර, යේසුස් ක්‍රිස්තුස්වහන්සේ නමැති දෙවියන් වහන්සේගේ පුත්‍රයා, ස්වර්ගය සිට භූමියට මිනිසෙකු ලෙස පැමිණ, යෙරුසලමෙන් පිටත කුරුසියක් මත මැරුණේ, මේ දඬුවමින් අපව මුදවා ගැනීම පිණිසය. එහිදී උන් වහන්සේ මනුෂ්‍ය වර්ගයාගේ, එනම් සියලු ආගම් වලට අයිති ජනයාගේ පව් සියල්ල උදෙසා දේව දඬුවම දරා ගත්සේක. එහෙත් උන් වහන්සේ සොහොනක වලලා දින තුනකට පසුව, උන් වහන්සේ මරණයෙන් ජීවමානව නික්ම අවුත්, ඇත්තවශයෙන් උන් වහන්සේ දෙවියන් වහන්සේගේ පුත්‍රයා බවත්, උන් වහන්සේට මිනිසාගේ පරම සතුරා වන මරණය පරාජය කළ හැකි බවත් ප්‍රත්‍යක්ෂ කළ සේක. දින හතලිහකට පසුව, බොහෝ දෙනා උන් වහන්සේ දෙස බලා සිටි අවස්ථාවක, නියම වේලාවක සියලු මනුෂ්‍යයන් විනිශ්චය කරනු පිණිස නැවත පෘතුවියට එන බව පොරොන්දු වෙමින් ස්වර්ගයට ඔසවාගනු ලැබුසේක. උන් වහන්සේ ඒ පොරොන්දුව දුන් පසු වසර

1950 කට වැඩි කාලයක් ගතවී ඇත. මේ දින වලින් එකක උන් වහන්සේ ස්වර්ගයෙන් සිටි ආපසු පැමිණීම, අහස් කුසයෙහි අපට පෙනෙන්නට යන්නේය.

ඉතිහාසයෙහි මිනිස් වර්ගයාගේ පාප උදෙසා මැරුණු එකම තැනැත්තා යේසුස් ක්‍රිස්තුස් වහන්සේය. තවද මළවුන්ගෙන් නැවත උත්ථානය වූ එකම තැනැත්තාත් උන්වහන්සේමය. මේ කාරණාවල් දෙස සම්බන්ධයෙන් උන් වහන්සේ අසහායය.

අද අප අවංකව අපගේ පව් වලින් ඉවතට හැරී, ඒවා ගැන පශ්චාතාපවී උන් වහන්සේ අපගේ පව් උදෙසා මරණයට පත්වී, මළවුන් අතරෙන් නැවත උත්ථානය වූ බව විශ්වාස කර, යේසුස් ක්‍රිස්තුස් වහන්සේ නිසා අපට සමාව දෙන්නට කියා දෙවියන් වහන්සේගෙන් ඉල්ලා සිටියොත් අපගේ පව් වලට සමාව ලැබ, විඩියෝ-පටයෙන් ඒවා මකා දමන්නට හැකිය.

ඔබගේ පව් කොතරම් මහත් වුවද, අධික වූද තිබුනත්, ඔබගේ ජීවිතය තුළට අවුත් අතීත ජිවිතයේ වාර්තාව මකන්නට කියා ඔබ දැන් ස්වාමි වූ යේසුස් ක්‍රිස්තුස් වහන්සේගෙන් ඉල්ලන්ට හැකිය. එවිට, පිරිසිදු සටහනක් ඇතුව ඔබට නැවත ජීවිතය ආරම්භ කරමින් දේව දරුවෙකු විය හැකිය.

මිනිස් වර්ගයා උදෙසා දෙවියන් වහන්සේ නියම



කර ඇති එකම ගැළවීමේ මාර්ගය මෙයයි. දැන්ම ඔබ එයින් ප්‍රයෝජනයක් ගන්න. ඒ වෙනුවට ඔබට ඇති එකම දෙය නම් විනිශ්චය දවසේදී ඔබගේ මතකය නැමැති විඩියෝ-පටය ආපසු ක්‍රියා කරවීමෙන් ඔබගේ පව්වල සටහනට මුහුණ දීම බව මතක තබා ගන්න. මේ සත්‍යය දැනගෙන, ගිනි විලක සියලු පව් කරුවන්ට ඇති සදාකාල විනිශ්චයේ බරපතලකම අවබෝධ කරමින්, ප්‍රේමණීය අන්දමින්, සෑම දෙනාටම, අනතුරු ඇඟවීම දීම, අපගේ යුතුකමවේ.

තවත් ප්‍රමාද නොවී, ඔබ අද ඒ නිවැරදි තීරණය ගනු මැන. එසේ කිරීමෙන් දෙවියන් වහන්සේ ඔබට සදාකාල ජීවනයෙන් ආශිර්වාද කරනු මැන.

අපි අවංක ප්‍රේමයක් තුළ ඔබට මේ පණිවුඩය පිරිනමන්නෙමුව. **ෂැක් පුනන්**

**වැඩි විස්තර දැන ගැනීමට පහත සඳහන් ලිපිනයට ලියන්න**